දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍ය / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල් – மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
இசுருபாய ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව

මගේ අංකය / எனது இல. / My No. ED/01/12/09/03/02

දිනය / திகதி / Date 2016.04. 27

**චක්‍රලේඛ අංක : 12/2016**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම රජයේ හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

පාසල තුළ විනය ආරක්ෂා කිරීම

සමාජ සංස්ථාවක් ලෙසින් පාසලට පැවරෙන ප්‍රමුඛ කර්තව්‍යයක් වන්නේ තම සමාජයට අයත් සංස්කෘතික දායාදයන් අනාගත පරපුරට හිමිකර දෙමින්, යහපත් පරිසරයක් පවත්වා ගෙන යාම සඳහා වත්මන් සිසු පරපුර අනාගත ලොවට ඔබින ආකාරයට සකස් කිරීම ය. මෙහි දී සමාජය තුළ විනය ආරක්ෂා කරමින් සමාජ සහකම්පනයෙන් යුතු ව ජීවත්වන ආකාරයට යෝග්‍ය ආකල්ප හා සාරධර්ම සිසුන් තුළ පුහුණු කිරීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ගයන් ගැනීම සිදු කළ යුතු ව ඇත.

වර්තමාන සංකීර්ණ සමාජ තත්ත්වය තුළ විවිධ බලපෑම් හේතුවෙන් පාසල් සිසුන් තුළ මතු වන අයෝග්‍ය හැසිරීම් පාලනය කරලීමේ අරමුණින් සිසුනට සිදු කෙරෙන දඬුවම් තුළින් ශාරීරික ව හිංසනයන් සිදු වන බවට වාර්තා වී ඇති බැවින් එම තත්ත්වයන් අවම කරලීම සඳහා පාසල් තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005.05.11 දිනැති අංක 17/2005 දරන චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛයේ විධි විධාන 2016.05.02 වන දින සිට බලපැවැත්වේ.

එබැවින්, පාසලට පැමිණෙන සිසුන්ගේ ආරක්ෂාව සලසමින් ඔවුනට සිදුවන හිංසනයන් වැළැක්වීම සඳහා විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙහි සඳහන් උපදෙස් පිළිපදින ලෙස අවධාරණය කරමි.

**1.0 පාසල් විනය**

1.1 පාසලක විනය ආරක්ෂා කිරීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ එම පාසල හා පාසල් සංස්කෘතිය විසින් පිළිගෙන ඇති ශිෂ්‍ය හා වැඩිහිටි (අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් හා දෙමාපියන්) හැසිරීම් රටාවන් බාධාවකින් තොර ව පවත්වා ගෙන යාම සඳහා සකසා ඇති පාසල් නීති මාලාවන්වලට අනුගත වෙමින් කටයුතු කිරීම යි.

1.2. ඒ අනුව, පාසලක විනය පවත්වා ගෙන යාමේ දී සලකා බලනු ලබන කරුණු සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වයන් විසින් පහත සඳහන් අදහස් ඉදිරිපත් කර ඇත.

(අ) ළමයින් හා මනා සබඳතාවයන් ගොඩ නංවා ගනිමින් ශිෂ්‍යයන්ට තම වගකීම් පිළිබඳ හැඟීම් ක්‍රමානුකූල ව ලබා දීම තුළින් සිසුන් තුළ ස්වයං විනයක් ඇති කිරීමට ගුරුවරුන්ට හැකියාවක් පවතින බව.

(ආ) ගුරුවරුන්ට මෙන් ම ශිෂ්‍යයන්ට ද තම තමන්ට බලපවත්වනු ලබන පෞද්ගලික වූ ගැටලු පවතී. එම ගැටලු එකිනෙකින් වෙන් ව හඳුනා ගැනීමටත්, එසේ හඳුනා ගනු ලබන ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයන් සපයා ගැනීමට හැකි දැනුමත් කුසලතාවයන් ගුරුවරුන් තුළ වර්ධනය කිරීම තුළින් ද ශිෂ්‍ය විනය පවත්වා ගෙන යාමට හැකියාවන් පැවතීම.

(ඇ) පාසල තුළ ශිෂ්‍යයන්ට ගැලපෙන ඉගෙනුම් පරිසරයක් ගොඩ නැංවීම හා එයට සමගාමීව පාසල සඳහා හඳුනා ගත් අධ්‍යාපන දර්ශනයන් සමග ශිෂ්‍ය කුසලතා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම තුළින් ස්වයං විනයකට ශිෂ්‍යයන් යොමු කරවීමට හැකියාව ලැබීම මගින් ද විනය පවත්වාගෙන යාමේ ඇති හැකියාව වැඩි වීම.

1.3 වර්තමානයේ දී පාසල් තුළ විනය පවත්වා ගෙන යාම සඳහා පාසල විසින් විවිධ ක්‍රියා මාර්ග ගනු ලබයි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශාරීරික දඬුවම් තහනම් කර තිබුණ ද ඇතැම් අවස්ථාවල දී වරදේ ස්වභාවය අනුව ශාරීරික දඬුවම් ලබා දීම සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

## 2.0 ශාරීරික දඬුවම්

2.1 ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව සැලසීමේ දී දෙමාපියන්ට හා සමාන වගකීමක් ගුරුවරුන්ට ද හිමි වේ ය, යන සංකල්පය පදනම් කරගත් " in Loco Parentis " යන සංකල්පය පදනම් කර ගෙන පාසල තුළ දී අපේක්ෂිත චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන්ගේ එම අයෝග්‍ය චර්යාවන් වැළැක්වීම සඳහා ශාරීරිකව වේදනාවක් ඇති වන අන්දමින් කරන දඬුවමක් ශාරීරික දඬුවමක් ලෙස හඳුන්වනු ලැබේ.

වෛද්‍යවරුන්, මනෝ විද්‍යාඥයන්, මානව ක්‍රියාකාරිකයන් වැනි කණ්ඩායම් ශාරීරික දඬුවම් පැහැදිලි කරනු ලැබ ඇත්තේ ළමයිනට කායික වශයෙන් පීඩනයක් වන ආකාරයට ලබා දෙනු ලබන දඬුවමක් ලෙස ය. ඔවුන් තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ එය අදාළ සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා, අනාගතයේ දී සමාජ විරෝධී චර්යාවන්ට යොමු වීමට පවතින ඉඩකඩ වැඩිවීම මෙන් ම පසුකාලීන ව ඔවුන් තුළ දැඩි මානසික ආතති තත්ත්වයන් ද වර්ධනය විය හැකි බව ය.

එහෙත්, මෙවන් පහරදීම් මගින් ලැබෙන යහපත් ප්‍රතිඵලයන්ට වඩා අයහපත් ප්‍රතිඵලයන් වැඩි බව අනාවරණය වීමෙන් පසු ව, බොහෝ සංවර්ධිත රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වර්තමානය වන විට ශාරීරික දණ්ඩනය අත්හිටුවීමට පියවර ගෙන ඇත. එමෙන් ම මෙවන් දණ්ඩනයන් මගින් ශිෂ්‍ය චර්යාවන් පන්ති කාමරය තුළ දී සංවර්ධනය වූ බවට පවතින සාක්ෂි අවම නිසා ශාරීරික දණ්ඩනය ප්‍රයෝජනයක් නොමැති ක්‍රියාවලියක් බව පෙනී ගොස් ඇත. එනිසා සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන් සද්භාවයෙන් යුතු ව වුව ද කිසිදු ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ශාරීරිකව පීඩනයක් විය හැකි ආකාරයේ දඬුවම් ලබාදීමෙන් වැළකී සිටීමට පියවර ගෙන වග බලා ගත යුතු වේ.

2.2 ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ස්ථිර කර ඇති 1989 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28 (2) වගන්තිය මගින් පාසල තුළ විනය පරිපාලනය සිදු කිරීමේ දී ළමයාගේ මානව ගරුත්වයට අනුකූලව එය සිදු කළ යුතු බවට අවධාරණය කර ඇත.

2.2.1 ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණයන්ගෙන් අනාවරණය වී ඇත්තේ ද චර්යාව හැඩ ගැස්වීම් සම්බන්ධයෙන් ළමුනට ලබා දෙන ලද දඬුවම මගින් අපේක්ෂිත ප්‍රතිඵලයන් ලැබී නොමැති බවත් වෙනත් අයහපත් ප්‍රතිඵලයන් එමගින් නිර්මාණය වන බවත් ය. එසේ නිර්මාණය විය හැකි අයහපත් ප්‍රතිඵල නම්,

i. ශාරීරික දඬුවම තුළින් ප්‍රචණ්ඩත්වය, පහරදීම්, සොරකම වැනි සමාජ විරෝධී චර්යාවන් සිසුන් තුළ මතු වීම.

ii. ළමා අපහරණයට ඇති අවදානම වැඩිවීම.

iii. සිසුන් තුළ ආක්‍රමණශීලී හා කලහකාරී චර්යා රටා මතුවීම.

iv. ශිෂ්‍යයා, ගුරුවරයා හා විදුහල්පතිවරයා අතර පවත්නා සම්බන්ධතාවය ක්‍රමයෙන් දුරස්ථ වී යාම.

v. නිශේධනාත්මක සමාජ හා මානසික කැළඹීම් තත්ත්වයකට ළමයා පත්වීම.

vi. ළමයා විසින් සංකල්ප ගොඩ නගා ගැනීමේ දී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇතිවීම.

vii. පසු කාලීන ව මෙවන් සිසුන් තුළ පරාජිත මානසිකත්වයක් වර්ධනය වීමෙන් සමාජ විරෝධී ආකල්ප ඇත්තෙකු දැයට නිර්මාණය වීමට වැඩි ඉඩකඩක් මතුවීම.

viii. පොදු දේපල විනාශ කරන තැනැත්තෙකු බවට පත් කිරීම.

ix. ශිෂ්‍යයන්ගේ පහළ අධ්‍යාපන සාධන ඇති වීම.

යන ලක්ෂණ හඳුනාගත හැකි ය.

2.2.2 පාසල විසින් පිළිගත් චර්යාවන්ට නොගැළපෙන චර්යාවන් දක්වන සිසුන් නිවැරදි චර්යා රටාවන්ට හැඩ ගැස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල් විනය මණ්ඩලයක් පිහිටුවිය යුතු ය.

**2.3 විනය මණ්ඩලයේ සංයුතිය :-**

පාසලේ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති, විනය භාර ආචාර්ය, අංශ ප්‍රධානියෙකු ඇතුළු ගුරු මණ්ඩලයේ සාමාජිකයන් ඇතුළත් වන සේ පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාවට ගැළපෙන පරිදි විනය මණ්ඩලයක් පත් කර ගත යුතු වේ.

2.3.1 සිසුන්ගේ අයථා හැසිරීමට අදාල ව විනය මණ්ඩලයේ කාර්යභාරය :-

විනය මණ්ඩලයට පාසල තුළ සිදු කිරීමට ඇති බොහෝ කාර්යභාරයන් අතර අදාළ සිසුන් විසින් කර ඇති අයෝග්‍ය හැසිරීම් පිළිබඳව විමර්ශනය කර ඒ පිළිබඳව ලබා ගන්නා සියලු සාක්ෂි විධිමත් ව ගොනු කර තිබිය යුතු අතර, ඒ පිළිබඳව වෙන ම ලේඛන පවත්වා ගත යුතු ය. එසේ ලබා ගන්නා තොරතුරු පදනම් කර ගෙන පාසල තුළ ශිෂ්‍ය විනය පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත හැක.

2.3.2 ශාරීරික දඬුවම් වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

i. පාසලේ සිටින සිසුන් විනය විරෝධී ක්‍රියාවන්හි යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීම පිණිස පාසලේ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් මනාව සංවිධානය කර තිබීම හා සිසුන් විසින් සිදු කරන යහපත් ක්‍රියාවන් විශේෂ ඇගයීමකට ලක් කිරීම.
ii. පාසලේ විනය නීති පද්ධතිය පිළිබඳව සියලු දෙනා ම දැනුවත් කිරීම හා යහපත් ක්‍රියා ප්‍රතිපෝෂණය කිරීම කළ යුතු අතර, වැරදි ක්‍රියාවන් අනුමත නොකිරීම හා ඒ සඳහා කිසිදු ආකාරයක අනුබලයක් ලබා නොදීම.
iii. මනා හැසිරීම් රටාවන් ඇති කිරීමටත්, පාසල තුළ විනය පවත්වා ගෙන යාමටත්, විනයානුකූල ව හැසිරීමේ වැදගත්කම අවබෝධ කර දීම හා සිසුනට නිසි මාර්ගෝපදේශකත්වයක් ලබා දීම.
iv. ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් වරදක් සිදු කරන ලද අවස්ථාවක දී ඔහු/ඇය විසින් කරන ලද වරද අවබෝධ කර දීම.
v. තදබල විනය විරෝධී කටයුතු සිදු කළ අවස්ථාවන්වල දී ද ශාරීරික දඬුවම් දීම වෙනුවට අවවාද කිරීම හා අවස්ථාවෝචිත පරිදි දෙමාපියන් භාරකරුවන් ගෙන්වා ඒ පිළිබඳ පැහැදිලි කර ඔවුන් දැනුවත් කිරීම. (ශාරීරික හා මානසික පීඩාවට ලක් නොවන පරිදි සිසුන්ගේ මානසිකත්වය සංවර්ධනය කළ හැකි ක්‍රියාමාර්ගයන් සඳහා කටයුතු කිරීම වැදගත් වේ.)
vi. එලෙස තදබල විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇති විටක දී දෙමාපියන් භාරකරුවන් මෙන් ම අධ්‍යාපන බලධාරීන් ද දැනුවත් කර සති 02 කට නොවැඩි කෙටි කාලීන පන්ති තහනමක් ක්‍රියාත්මක කිරීම.
vii. වරද සිදු කරන ලද ශිෂ්‍යයා / ශිෂ්‍යාව භුක්ති විඳින ලද වරප්‍රසාද සීමා කිරීම/ අත් හිටුවීම.
(උදා :- ශිෂ්‍ය නායක, [illegible] කණ්ඩායම්/ [illegible] ඉවත් කිරීම)

viii පාසලේ විනය මණ්ඩලය විසින් ළමයා බරපතල විනය විරෝධී ක්‍රියාවන් සිදු කර ඇති බව තීරණය කරනු ලැබූ අවස්ථාවක දී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇති ව සති දෙකකට වැඩි කාලයත් පන්ති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියට ම මාරු කිරීම.

ඉහත vi හා vii පරිදි ක්‍රියාකිරීමේ දී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමඟින් සිදු කරනු ලබන නිසි පරීක්ෂණයකින් පසු ව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ ක්‍රියා කළ යුතු ය.
සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ දී ඒ පිළිබඳ වාර්තා ලේඛනගත කළ යුතු අතර, ඒවා පරිස්සමෙන් විදුහලේ තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

එමෙන් ම ඉහත vii හා viii හි සඳහන් ක්‍රියාමාර්ග ගැනීමේ දී විදුහල්පති විසින් ඒ පිළිබඳව දෙමාපියන් ද දැනුවත් කළ යුතු යි. ඉහත සඳහන් පරිදි සිසුන් තුළ වින්‍යාසය නැතිවීම රටාව ඇති කරලීමේ අරමුණින් ගනු ලබන ක්‍රියාමාර්ග විදුහලේ ප්‍රධාන රැස්වීමේ දී හෝ දැන්වීම් පුවරු ආදිය මඟින් පාසල තුළ ප්‍රසිද්ධ නොකිරීමට වග බලා ගත යුතු ය. එවන් ක්‍රියාමාර්ග ගත යුත්තේ සිසුවාගේ/සිසුවියගේ පෞද්ගලිකත්වය රැකෙන අයුරින් බව අවධාරණය කරමි.

2.4 පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදු කළහොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ග වලට මුහුණ දීමට සිදු වනු ඇත.

i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව හා xvi පරිච්ඡේදයේ 126 වැනි ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

ii. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහයේ 3 වන වගන්තියේ හා ප්‍රධාන ප්‍රඥප්තියේ 308 (අ) වගන්තිය පරිදි ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද යටතේ නඩු නිමිත්තක් උද්ගත විය හැක. ඒ අනුව, එම සිදුවීමට අදාළව ඉදිරිපත් වී ඇති කරුණු විමර්ශනයේ දී ඒ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගත හැකි බවට නීතිපති වාර්තා කරන්නේ නම් අදාළ වරදකරුවන්ට එරෙහි ව නඩු පැවරිය හැක.

iii. අධ්‍යාපනයට අදාළ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණවලින් ශාරීරික දඬුවම් ලබා දී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැක.

## 3.0 ළමා අපහරණය

3.1 ළමා වියට නොගැළපෙන විවිධ නොනිසි ක්‍රියා සඳහා ළමයින් යොදවා ගැනීම ළමා අපහරණය ලෙස හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වසර ගණනක සිට ළමා අපහරණ සිද්ධීන් ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, වර්තමානයේ විවිධ ආකාරයේ ළමා අපහරණ සිද්ධීන් රාශියක් දිනපතා වාර්තා වන තත්ත්වයකට පත් ව ඇත.

3.2 ළමා අපහරණ අතරින් ලිංගික අපහරණයට සිසු/සිසුවියන් යොදවා ගැනීම ඉතා බරපතල වරදකි. ශ්‍රී ලංකාවේ 80 දශකයේ මැද භාගයේ ළමා හා නායික අපයෝජනය වරදක් බවත්, 90 දශකයේ මුල් භාගයේ දී ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවත් හඳුනාගෙන ඇත.

එනිසා, පාසල තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිසියම් වූ අපයෝජනයකට ලක් වීම වළක්වා ගැනීම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වගකීම වේ. පාසල තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලිංගික හා වෙනත් අපයෝජනයක් සිදු කර ඇත්නම් එය සත්‍ය බව ඔප්පු වුවහොත් බරපතල දඬුවම්වලට ලක්විය හැකි බව විශේෂයෙන් අවධාරණය කරමි.

3.3 පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද ඇතුළු ව පාසල තුළ සිදු කරනු ලබන සියලු කාර්යයන්වලට බාධා සිදු වන අයුරින් විදුහලේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් විසින් විනය විරෝධී ක්‍රියාවකට සිසුන් පෙළඹවීම කිසිසේත් නොකළ යුතු ය. සිසුන් විනය විරෝධී ක්‍රියාවලට පෙළඹවීමක් එවැනි පිරිස් වෙතින් ඇති කර ඇති බවට චෝදනා ඉදිරිපත් කර ඇති විටක එම චෝදනා ඔප්පු වුවහොත් සිසුන් පෙළඹවීම් සම්බන්ධයෙන් අදාළ කණ්ඩායම් හෝ පුද්ගලයෙකු වෙත දැඩි දඬුවම් ලබා දිය හැකි ය.

මෙසේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී ඉහත 2.3. I. II හා III හි සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇති බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

4.0 ළමා හිංසනය සම්බන්ධයෙන් සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම ඇතුළු විශේෂ බලතල රාශියක් සහිතව 1998 අංක 50 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. එම අධිකාරිය මඟින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාසල් ප්‍රධානීන්ගේ කිසියම් සහායක් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක දී ඊ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය එම අධිකාරිය වෙත ලබාදෙන ලෙස ද මෙමඟින් උපදෙස් දෙමි.

තව ද, අමානුෂික දණ්ඩනීන් කායික හෝ මානසික දඬුවම් ලබා දීමෙන් තොර ව පාසල තුළ විනය පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන අතර, පාසල තුළ ළමා අපයෝජන ක්‍රියා සිදු නොවන වාතාවරණයක් ඇති කර ගැනීමටත් වග බලා ගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා විදුහල්පතිවරුන් හා ගුරු මහත්ම මහත්මීන් කටයුතු කිරීම උදක් ම අපේක්ෂා කරමි.

ඩබ්ලිව්.එම්.බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

| | | |
|---|---|---|
| 01. ලේකම් | - | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 02. ලේකම් | - | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 03. ලේකම් | - | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| 04. ලේකම් | - | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය |
| 05. අධ්‍යක්ෂ ජනරාල් | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| 06. සභාපති | - | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 07. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් | - | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 08. විභාග කොමසාරිස් ජනරාල් | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| 09. සභාපති | - | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය |
| 10. සියලු ම ශාඛා ප්‍රධානීන් | - | අධ්‍යාපන අමාත්‍යාංශය |